# බේරුවල ප්‍රාදේශීය සභාව
# කළුතර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 24 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 ජූලි 01 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම් අංක 80034064 දරන ස්ථාවර තැන්පතුවට අදාලව 2016 වර්ෂය සඳහා ලැබිය යුතු රු.31,068 ක් වූ පොලිය ගිණුම් ගත නොකිරීම හේතුවෙන් වර්ෂයේ පොලී ආදායම හා ලැබිය යුතු ආදායම් රු.31,068 ක් බැගින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ලීබඩු සවිකිරීම් හා කාර්යාල උපකරණ ගිණුමට ඇතුළත් විය යුතු රු.37,500 ක් වූ සමරු එලක 03 ක් යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ ගිණුමට ඇතුළත් වී තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.209,903,285 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු.37,319,213 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු. 10,418,071 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.26,901,142 ක වර්ධනයක් දක්නට ලැබුණි.

මූල්‍ය ප්‍රතිඵලයේ රු.26,901,142 ක වර්ධනය කෙරෙහි ආදායම් රු.39,269,847 කින් වැඩිවීම හා වියදම් රු.12,368,705 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2:2 **<u>මූල්‍ය පාලනය</u>**

කිසිම රජයේ බැංකු ගිණුමකින් අයිරා ලබාගැනීම තහනම් වුවත්, ඊට අනුගත නොවී කටයුතු කිරීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට සභාවේ අංක 2757387 දරන ජංගම ගිණුමේ රු.1,035,605 ක අයිරාවක් පැවති අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.25,566 ක හා ඉකුත් වර්ෂය වෙනුවෙන් රු.21,655 ක අයිරා පොලී ගෙවා තිබුණි.

2.3 **<u>ආදායම් පරිපාලනය</u>**

2.3.1 **<u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>**

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 16,090 | 10,262 | 13,161 |
| (ii) බදු කුලී | 15,714 | 14,345 | 3,599 |
| (iii) බලපත්‍ර ගාස්තු | 2,473 | 2,473 | -- |
| (v) වෙනත් ආදායම් | 159 | 157 | 02 |

2.3.2 **<u>වරිපනම් බදු</u>**

(අ) 2015 වර්ෂය හා ඊට පෙර සිට පැවත එන හිඟ වරිපනම් බදු ශේෂය රු.14,099,099 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් අයකරගෙන තිබුණේ රු.5,795,005 ක් හෙවත් සියයට 41 ක් පමණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා රු.12,032,043 ක් බිල් කර ඇති නමුත් ඉන් අයකරගෙන තිබුණේ රු.7,709,507 ක් හෙවත් සියයට 64 ක් පමණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට රු.12,626,630 ක් වූ හිඟ වරිපනම් ආදායම තුළ වසර 01 සිට වසර 03 දක්වා ඒකක 4190 කින් රු.3,487,907 ක්, වසර 03 සිට 05 දක්වා ඒකක 2388 කින් රු.3,124,342 ක්, වසර 05 සිට 10 දක්වා ඒකක 2813 කින් රු.4,018,877 ක් හා වසර 10 ට වැඩි ඒකක 1105 කින් රු.1,356,011 ක මුදලක් ඇතුළත් වූ අතර මෙම මුදල් අයකරගැනීමට සභාව විසින් විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

(ඈ) සභාව විසින් හිඟ වරිපනම් බදු අයකරගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකසා නොතිබුණු අතර හිඟ බදු අයකරගැනීම සඳහා විනිග්‍රහ බලපත්‍ර නිකුත් කර තිබුණේ දර්ගා නගරයේ උප කාර්යාලයේ පමණි.

2.3.3 **සන්නිවේදන කුළුණුවලින් බලපත්‍ර ගාස්තු අයකිරීම**

පයාගල උප කාර්යාලය විසින් සන්නිවේදන කුළුණු 08 කින් 2016 වර්ෂය සඳහා රු.24,000 ක් වූ බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි.

2.3.4 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 31,830,011 |
| (ii) | මුද්දර ගාස්තු | 50,509,153 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) **පාඨකයින් විසින් ආපසු භාර නොදුන් පුස්තකාල පොත්**

සභාව විසින් පවත්වාගෙන යනු ලබන පුස්තකාලවල බැහැර දෙන අංශයෙන් පාඨකයින් විසින් ලබාගෙන 2017 පෙබරවාරි 03 වන විටත් ආපසු භාර නොදුන් පොත් 215 ක වටිනාකම රු.29,097 ක් විය. මෙම පොත් 2015 ජූනි මාසයට පෙර බැහැර දුන් ඒවා විය.

(ආ) **මහජන පැමිණිලි (අළුත්ගම උප කාර්යාලය)**

(i) සෞඛ්‍ය ගැටළු සඳහා මහජන පැමිණිලි ලේඛනයක් පවත්වාගෙන ගොස් තිබූ අතර 2016 වර්ෂය සඳහා පැමිණිලි 5 ක් පමණක් සටහන් කරගෙන තිබුණි. එම පැමිණිලි සෞඛ්‍ය පරීක්ෂක වෙත භාර දී තිබූ නමුත් එහි ප්‍රගතිය පිළිබඳව ලේඛනයේ සටහන් කර නොතිබුණි.

(ii) විදුලි පැමිණිලි සඳහා මහජන පැමිණිලි ලේඛනයක් තිබුණද එම පැමිණිලි සටහන් කිරීම පමණක් සිදු කර තිබුණි. ප්‍රගතිය සටහන් කර නොතිබුණි.

(iii) පොදු පැමිණිලි සඳහා වෙනම ලේඛනයක් පවත්වා නොතිබූ අතර පැවති ලේඛනයේ ප්‍රධාන කාර්යාලයෙන් එවනු ලබන සියලුම ලිපිද ඇතුළත් කර තිබුණි.

(ඇ) <u>වාහන පාලනය</u>

(i) සභාව සතු ට්‍රැක්ටර් රථයක් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකළ අතර එම ට්‍රැක්ටර් රථය භෞතිකව තිබෙන ස්ථානයක් පෙන්වීමට සභාව අසමත් විය.

(ii) සභාවට අයත් කෘ කැබ් රථයට අදාල ලොග් පොත පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

- වාහනයේ ඉන්ධන දැවීම පිළිබඳ පරීක්ෂා කර නොතිබුණි.
- වාර්ෂික බලපත්‍ර, ආයුධ හා අමතර උපකරණ පිළිබඳ සඳහන් කර නොතිබුණි.
- අළුත්වැඩියා විස්තර නොතිබුණි.

(iii) වාහනවල ලොග් පොත් පිළිබඳ නියදි පරීක්ෂාවට අනුව ලොග් පොත් බොහොමයක් අසම්පූර්ණව පැවතුණි. එකී ලොග් පොත්වල ඇතුළත් කළ යුතු වාහනය පිළිබඳ විස්තර, දැවෙන ඉන්ධන ප්‍රමාණය, අළුත්වැඩියා කටයුතු, ටයර් ටියුබ් දැමීම, වාහන සේවා කිරීම ඇතුළු අනෙකුත් තොරතුරු ඇතුළත් නොකළ අවස්ථා පැවතුණි.

(ඇ) <u>සංචාරක සංවර්ධන බදු මුදල්</u>

(i) සංචාරක සංවර්ධන බදු මුදල් අයකිරීමේදී ආයතන 06 ක, පිළිගත් විගණන ආයතනයක් විසින් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන පදනම් කර නොගත් අවස්ථා නිරීක්ෂණය විය.

(ii) ලංකා ප්‍රින්සස් හෝටලය 2014 වර්ෂයේ ජනවාරි සිට ජූනි මාසය දක්වා ආදායමෙන් සියයට එකක සංචාරක සංවර්ධන බදු ලෙස සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබූ මුදල රු.3,798,665 ක් වුවද, 2014 වර්ෂය සඳහා සභාව වෙත සියයට එකක බදු ලෙස ගෙවා තිබුණේ රු.98,805 ක් පමණි. 2016 වර්ෂය සඳහා ගෙවා තිබුණේ රු.95,382 ක් පමණි.

(iii) ලලුනා හෝටලයේ 2013/2014 අවසන් ගිණුම් අනුව 2015 වර්ෂය සඳහා අය විය යුතු සියයට එකක බදු මුදල රු.140,852 ක් වුවත් අයකර තිබුණේ රු.49,257 ක් බැවින් රු.91,635 ක් අඩුවෙන් අයකර තිබුණි. 2014/2015 මූල්‍ය ප්‍රකාශන අනුව

2016 වර්ෂය සඳහා අය විය යුතු බදු මුදල රු.182,500 ක් වුවත් අයකර තිබුණේ රු.69,330 ක් වූයෙන් රු.113,190 ක් අඩුවෙන් අයකර තිබුණි.

(iv) සිනමන් බේ හෝටලයේ 2016 වර්ෂය සඳහා සියයට එකක බදු මුදල් අයකිරීමේදී ආහාර විකුණුම් පමණක් පදනම් කරගෙන තිබුණි.

(ඉ) <u>කඩ කාමර කුලියට දීම</u>

සභාව සතු අළුත්ගම පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 27 ක් කිසිදු ආදායම් ඉපයීමක් නොමැතිව වසර 15 ක පමණ කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණි.

(ඊ) <u>මුද්දර ගාස්තු</u>

ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් අයවිය යුතු මුද්දර ගාස්තු අයකරගැනීමේ ප්‍රමාදයන් පැවතුණි.

(උ) <u>පුද්ගලික ඉල්ලීම් සඳහා උපකරණ සැපයීම</u>

සභාව විසින් පුද්ගලික ඉල්ලීම්වලට අනුව (අවශ්‍යතාවය නිවැරදිව සඳහන් කරමින්/ නොකරමින්) ජලය පිරවූ ටැංකි හා පුටු විශාල වශයෙන් ලබාදුන් අවස්ථා පැවති අතර එහිදී විධිමත් අනුමැතියක් නොතිබීම, ලේඛනගත කර නොතිබීම හා ආපසු භාර නොදුන් අවස්ථා නිරීක්ෂණය විය.

(ඌ) <u>සති පොළ පවතින ස්ථානයේ කඩකාමර ඉදිකිරීම</u>

රාජ්‍ය නොවන සංවිධානයක මුදල් ආධාරයෙන් 2013 වර්ෂයේදී සති පොල පවතින ස්ථානයේ කඩකාමර කඩා නවීකරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) පැරණි කඩකාමර තිබූ අවස්ථාවේදීද විවෘත කර තිබුණේ කඩ කාමර 7 ක් පමණි.

(ii) 2017 පෙබරවාරි 03 දින වන විට විවෘත කර ඇත්තේ කඩකාමර 05 ක් පමණි.

(iii) මෙම සියලුම කඩකාමරවලින් කුලී අය නොවන බව නිරීක්ෂණය විය.

(iv) වැසිකිලි පහසුකම් නිසි පරිදි නොතිබුණි.

(v) කඩකාමර වඩා ඵලදායී වන ආකාරයට පාරට විවෘත වන සේ සැලසුම් කර නොතිබුණි.

(එ) **වෙන්දේසි ඉඩම්**

(i) බුළුගහලන්ද එස්ටේට් නැමැති කැබලි කර විකුණූ ඉඩමෙන් පොදු කටයුතු සඳහා සභාවට හිමිව තිබූ අක්කර 1, පර්චස් 22 ක ඉඩම් කොටස පොදු කටයුතු සඳහා භාවිතා කළ නොහැකි බෑවුම් සහිත බිම් තීරයක් විය.

(ii) පහත සඳහන් ඉඩම් වෙන්දේසිවලින් සභාවට ලැබුණු ඉඩම් කොටස්වල සභාවේ අයිතිය තහවුරු වන නාමපුවරු සවිකර නොතිබුණි.

| **ඉඩම** | | **වෙන්දේසිකරු** |
|---|---|---|
| පිඹුරු අංක 243/ 2016 | බුළුගහලන්ද එස්ටේට් | වයිස් ප්‍රොපර්ටි සොලූෂන් ආයතනය |
| පිඹුරු අංක 6702 | -එම- | ප්‍රයිම් ලැන්ඩ් පුද්. සමාගම |

(iii) පහත සඳහන් ඉඩම් වෙන්දේසිවලින් සභාවට ලැබුණු ඉඩම් කොටස් කණු යොදා වෙන් කරදී නොතිබුණි.

| **ඉඩම** | | **වෙන්දේසිකරු** |
|---|---|---|
| පිඹුරු අංක 243/ 2016 | බුබුලේලන්ද එස්ටේට් | වයිස් ප්‍රොපර්ටි සොලූෂන් ආයතනය |
| පිඹුරු අංක 6702 | බුළුගහලන්ද එස්ටේට් | ප්‍රයිම් ලැන්ඩ් පුද්. සමාගම |

3.2 **නිශ්ක්‍රීය වත්කම්**

2006 වර්ෂයේදී ලබාගත් තාර උණු කිරීමේ යන්ත්‍රය ගත් දින සිටම කිසිදු ප්‍රයෝජනයකට නොගෙන මේ දක්වා අක්‍රියව තිබුණු අතර ඒ සඳහා රු.869,500 ක අත්තිකාරමක් පමණක් 2006 සැප්තැම්බර් 22 දින ගෙවා තිබුණි.

3.3 **මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

බේරුවල ප්‍රාදේශීය සභාව සතු ගාළුපාර අංක 290 දරන ගොඩනැගිල්ල බද්දු දීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සභා තීරණයක් මත මාසිකව රු.30,000 බැගින් මෙම ගොඩනැගිල්ල බද්දු දී තිබුණි. එම නිසා අදාල ස්ථානයේ ඇති වෙනත් කඩකාමර හා

සසඳන විට තරඟකාරී මිල ගණන් මත සභාවට වාසිදායක අයුරින් ඉහල බදු මුදලක් ලබාගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

(ආ) පළමුවරට 2011 දෙසැම්බර් 01 දින සිට 2013 දෙසැම්බර් 01 දින දක්වා වූ වර්ෂ 02 ක් සඳහා බදුදී තිබූ අතර නැවත ආදායම් පරීක්ෂකගේ තක්සේරු වාර්තා මත මාසික බදු මුදල රු.33,000 බැගින් වර්ෂ 3 ක් සඳහා එම බදුකරුටම දීමට සභාපති අනුමැතිය දී තිබුණි. මේ සඳහා සභා තීරණයක් ගෙන නොතිබුණි.

(ඇ) බදු කාලය 2016 දෙසැම්බර් 01 දිනෙන් අවසන් වන බැවින් පුවත්පත් නිවේදනයක් මගින් නැවත බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබුණි. ඒ අනුව ආයුර්වේද සංස්ථාව මාසික කුලිය රු.60,000 බැගින් ගෙවා බදුගැනීමට එකඟතාවය පළ කර තිබුණද පෙර බදු කරු 2017 පෙබරවාරි වන විටත් ගොඩනැගිල්ල භාරදීමට කටයුතු කර නොතිබුණි.

## 3.4 කොන්ත්‍රාත් පාලනය

බේරුවල ප්‍රාදේශීය සභාවට අයත් මග්ගොන- කුමාරකන්ද මාර්ගයේ, මුංහේන මාර්ගය ආරම්භයේ සිට මීටර් 150 ක පමණ දුරක් ඉතා අබලන්ව පැවති අතර සභාව එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගෙන නොතිබුණි.

## 4. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් පාලනය

(ආ) අයවැය පාලනය

(ඇ) වාහන පාලනය

(ඈ) අභ්‍යන්තර විගණනය